# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2025.02.28 මාධ්‍ය නිවේදන අංක: 2025/015

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>අල්ලස් වශයෙන් රු.150,000/- ක් පිරිනැමීමේ චෝදනාව යටතේ අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචි සිවිල් කාන්තාවකට දඬුවම් නියම කෙරේ.</u>**

අවිස්සාවේල්ල පොලිස් ස්ථානයේ එවකට සේවය කළ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු විසින් සිදු කරන ලද පැමිණිල්ලකට අනුව, ගංජා ජාවාරම කිරීම යන වරද වෙනුවට ගංජා ලඟ තබා ගැනීම යන වරදට නඩු පැවරීමට, පෙළඹවීමට පැමිණිලිකරුට රුපියල් එක්ලක්ෂ පනස්දහසක් (රු.150,000) පිරිනැමීම යන චෝදනාව යටතේ එච්.සී.බී 290/24 මගින් ගොනු කළ නඩුවකට අදාළව, ගොඩේ විතානගේ අනුෂා සංජිවනී සේනානායක යන අයට දඬුවම් නියම විය.

ඒ අනුව, 2025.02.10 වන දින චූදිතට වසර 02 බරපතල වැඩ සහිත සිර දඬුවම් නියම කර එය වසර 15 අත්හිටුවන ලද අතර, රු.5000/= දඩයක් නියම කරන ලදි. එය නොගෙවන්නේ නම් මාස 06 ලිහිල් සිරදඬුවම් නියම කරන ලදි. තව ද, රු.150,000/= ක් වූ අල්ලස් මුදල රාජසන්තක කරන ලදි.

කොළඹ මහාධිකරණ අංක 07හි ගරු විනිසුරු ප්‍රදීප් අබේරත්න මැතිතුමා විසින් මෙම තීන්දුව ලබා දුන් අතර, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙනුවෙන් මෙම පැමිණිල්ල මෙහෙයවීම සහකාර අධ්‍යක්ෂ ජනරාල් තුෂාරි දයාරත්න මහත්මිය විසින් සිදු කරන ලදි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය
0112502672